**සේවක අර්ථසාධක අරමුදල - 2018**

**-----------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**---------------------------------**

සේවක අර්ථසාධක අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සේවක අර්ථසාධක අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී.ල.ගි.ප්‍ර 16 අනුව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වූ රු.76,656,104 ක් වටිනා ස්ථාවර වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒවායේ ඇස්තමේන්තු අගය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 අනුව අදාළ වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට ඉදිරියේ දී ක්‍රියාකරනු ලැබේ. | ප්‍රමිතය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය කර ඒ අනුව ක්ෂය ගැලපීම් කිරීම සිදුකල යුතු වීම. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට සේවායෝජකයින්ට එරෙහිව නඩු පැවරීමෙන් අයකරගෙන තිබූ රු.මිලියන 10,355 ක් කම්කරු කොමසාරිස් නමින් ගිණුමක දීර්ඝ කාලයක සිට නිරවුල් නොකර පවත්වාගෙන ගොස් තිබුණි. තවද, එසේ නඩු පැවරීමෙන් අයකරගෙන නිරවුල් කරන තෙක් පොදු තැන්පත් ගිණුමක එදිනට රඳවා තිබූ රු.මිලියන 301 ක් ද එක් එක් සාමාජික ගිණුම්වලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. තවද 2018 දෙසැම්බර් 31 දිනට රඳවාගත් ප්‍රතිලාභ හා හිමිකම් නොපෑ ප්‍රතිලාභ වශයෙන් රු.මිලියන 853 ක් සහ අඩුවැඩි දායක මුදල් වශයෙන් රු. මිලියන 1,796 ක් සාමාජික අරමුදල යටතේ දක්වා තිබුණද එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2018 වර්ෂය තුළ කම්කරු කොමසාරිස් ගිණුමට බැර වූ මුදල රු. මිලියන 8,436 ක් වූ අතර රු. මිලියන 8,910 ක් වර්ෂය තුල නිරවුල් කර ඇත. 2019.05.28 වන විට ශේෂය රු. මිලියන 248 ක්ව පැවති පොදු තැන්පතු දෛනිකව නිරවුල් වෙමින් පවතින අතර, එය ඉක්මනින් ගෙවා නිමකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>දායක මුදල් ගෙවීමේ ක්‍රමවේදයෙහි දෝෂ/දුර්වලතා අවම කිරීමට දැනට සාමාජිකයන් 50 ට වැඩි සේවායෝජකයන් සඳහා, විද්‍යුත් මාධ්‍ය මඟින් දායක මුදල් ගෙවීම අනිවාර්ය කර ඇත.<br>බැංකු ගිණුම් පිළිබඳ තොරතුරුවල පවතින දෝෂයන් හේතුවෙන් සාමාජිකයන් වෙත ගෙවන ලද ප්‍රතිලාභ මුදල් ආපසුහරවා එවනු ලබන අවස්ථාවලදී ඒවා නිරවුල් ගිණුම් වෙත නැවත ප්‍රේෂණය කරන තෙක් "හිමිකම් නොපෑ ගිණුම" ට බැර කෙරේ. එම දෝෂ නිරවුල් කිරීමෙන් පසුව මහ බැංකුවේ නිර්දේශ මත එම මුදල් ගෙවීමට කටයුතු කෙරේ.<br><br>රඳවාගත් ගිණුමෙහි පවතින මියගිය සාමාජිකයින්ගේ ප්‍රතිලාභ ආපසු ගෙවීම් කිරීමට හැකි වන්නේ කම්කරු කොමසාරිස්තුමා විසින් අනුතීරණ ලිපි මගින් රඳවාගත් කොටස, ගෙවිය යුතු අර්ථලාභීන්, දන්වා එවූ පසු පමණි. | නිරවුල් කර නොමැති දායක මුදල් අප්‍රමාදව නිරවුල් කිරීමට කාර්යක්ෂම වැඩපිළිවෙලක් සකස් කිරීමට ආයතනය කටයුතු කළ යුතු වීම. |
| (ආ) අරමුදල විසින් පවත්වාගෙන යන බැංකු ගිණුම් 07 කට අදාළව වසර 12 කට අධික කාලයක සිට බැංකු සැසඳුම් ප්‍රකාශයන්හි අගරු වූ චෙක්පත්, තැන්පත් කළ නමුත් අගරු වූ චෙක්පත් හා තැන්පත් කළ චෙක්පත් ආදී ශේෂ ලෙස එකතුව රු.මිලියන 1,035 ක් විය. තවද, තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ මුදල් ඇණවුම්, උපලබ්ධි නොවූ චෙක්පත් හා නිකුත් | බැංකු සැසඳුම් ප්‍රකාශයන්හි 2018 දෙසැම්බර් 31 දිනට පැවති නිරාකරණය නොවූ ශේෂ සම්බන්ධයෙන් අදාළ නිරවුල් කිරීමේ කටයුතු සිදු කරන අතරම විශේෂ විමර්ෂණ කිහිපයක නියැලී සිටින බැවින් සහ එයට අවශ්‍ය පහසුකම්/තොරතුරු සැකසීමේ කටයුතු සිදු කරන බැවින් බැංකු සැසඳුම් සම්බන්ධයෙන් සිදු කරන ව්‍යාපෘති වල යම් ප්‍රමාදයක් පවතී. | නිරාකරණය කර නොමැති බැංකු ශේෂ කඩිනමින් හඳුනාගෙන නිරවුල් කිරීමට සුදුසු වැඩපිළිවෙලක් සකස් කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් ලෙස එකතුව රු.මිලියන 1,563 ක් දක්වා තිබූ නමුත් මෙම අයිතම හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) 2018 වර්ෂයේ අවසන් කාර්තු 3 හි බදු වියදම සහ බදු වගකීම ගණනය කිරීමේදී භාණ්ඩාගාර බැඳුම්කර මත ක්‍රමක්ෂය ලාභ (Amortization gain on T.bonds) රු.4,807,290,569 ක් වැඩියෙන් ගණනය කිරීම හේතුවෙන් වර්ෂයේ බදු වියදම හා බදු වගකීම රු.673,020,680 ක් වැඩියෙන් පෙන්වා තිබුණි. | අදාළ අස්තමේන්තුවෙහි නිවැරදි කිරිම 2019 වසර ගිණුම් සඳහා ගලපනු ලැබේ. තවද 2018 වසරට අදාළව අවසාන ආදායම් බදු තක්සේරුව (Tax Return) පිළියෙළ කිරීමේදී මෙය නිවැරදි කර ඇත. එසේම, 2018 වසරට අදාළව කිසිදු ආදායම් බදු මුදලක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත වැඩිපුර ගෙවා (Over Payment) නොමැත. | වාර්ෂික බදු වියදම හා බදු වගකීම නිවැරදිව ගණනය කිරීමට ආයතනය කටයුතු කළ යුතු වීම. |

### 1.5.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම් බාණ්ඩ 04 ක 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.900,608,654 ක් වුවද, ක්ෂය වෙන්කිරීම සඳහා වූ උපලේඛනයේ එම ශේෂයන්ගේ එකතුව රු.556,974,678 ක් වූ බැවින් රු.343,633,976 ක වෙනසක් නිරීක්ෂණය විය. | පෙන්වා දී ඇති වෙනස්කම් මේ වන විට හඳුනාගෙන ඇති අතර ඊට අදාළ ගැලපීම් ඉදිරි මූල්‍ය ප්‍රකාශන තුලින් සිදුකිරීමට අපේක්ෂා කරමි. | ස්ථාවර වත්කම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට ආයතනය කටයුතු කළ යුතු වීම. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර | අරමුදලට අනුයුක්ත කර සිටින ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ගේ සේවා නියුක්ති ආදායම මත වූ | මෙම වසරේ සිට උපයන විට ගෙවීමේ බදු සේවකයන්ගේ වැටුපෙන් අයකර ගැනීමට | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව උපයන විට බදු ගෙවීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| චක්‍රලේඛයේ 8.7 වගන්තිය සහ 2016 අප්‍රේල් 29 දිනැති මුදල් අමාත්‍යාංශයේ අංක.PE/COP/POLI/ Circulars හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක : 03/2016 දරන ලිපිය | උපයන විට බදු ගෙවීම් අදාල නිලධාරීන්ගෙන් අය නොකර සමාලෝචිත වර්ෂයේ දී රු.20,947,681ක් අරමුදල විසින් ගෙවා තිබුණි. මේ පිළිබඳව 2016 පෙබරවාරි 26 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීමේදී උපයනවිට ගෙවීම් බදු අරමුදලින් ගෙවීම පිළිබඳව 2016 අයවැය ලේඛනයේ උපදෙස් හා රාජ්‍ය මුදල් චක්‍රලේඛවලට අනුකූල වන අන්දමින් ක්‍රමවේදයන් නිවැරදිව හා යාවත්කාලීන කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟ සාකච්ඡා කොට වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස දැන්වුවද එවැනි වැඩ පිළිවෙලක් 2018 අවසන් වන විටත් සකස් කර නොතිබුණි. | මුදල් මණ්ඩලය විසින් තීරණය කර ඇති අතර එය 2019.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ගේ මාසික වැටුපෙන් උපයන විට ගෙවීමේ බදු අඩු කර ඇත. | කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 190,617 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 202,947 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 12,330 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනත යටතේ බදු අනුපාතයන්ගේ ඉහල යෑම හේතුවෙන් අරමුදලේ ආදායම් බදු වියදම රු.මිලියන 11,823 කින් එනම්, සියයට 63 කින් ඉහල යෑම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව අරමුදලේ සාමාජිකයන්ට ගෙවිය යුතු වන පොලී ප්‍රතිලාභයන් 2009 වර්ෂයේ සිට 2014 දක්වා සියයට 13.75 සිට සියයට 10.5 දක්වා ක්‍රමිකව පහත වැටී තිබූ අතර 2015 සිට 2017 දක්වා නොකඩවා එම අනුපාතය පවත්වාගෙන ගොස් තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී එලෙස ගෙවන ලද පොලී ප්‍රතිශතය සියයට 9.5 දක්වා පහත වැටී තිබුණු අතර එම පොලී ප්‍රතිශතය ගෙවීම සඳහා ලාභය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලාභ සම කිරීමේ සංචිතයෙන් රු.මිලියන 6,000 ක් ලබාගෙන තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සාමාජිකයන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීමේ හා ගිණුම් ශේෂ පරීක්ෂා කිරීම සඳහා යන්ත්‍ර (Kiosk) සවි කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ 2008 දෙසැම්බර් මස රු.12,609,750 ක් වැයකර සකස් කරන ලද කාඩ්පත් 15,000 ක් හා රු.2,750,570 ක් වැයකර මිලදී ගන්නා ලද KIOSK යන්ත්‍ර 05 ක් නිෂ්කාර්යව ගබඩාවල පැවතුණි. මෙලෙස මුද්‍රණය කල කාඩ්පත් වසර 10 ක් පමණ තිස්සේ ගබඩා කර තැබීමෙන් හා යන්ත්‍ර මිලදීගත් දින සිට ක්‍රියාත්මක නොවීමෙන් ඒ සඳහා දරන ලද මුළු වියදම වූ රු.15,360,320 ක මුළු මුදලම අරමුදලට අලාභයක් වී තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | සාමාජික අරමුදලින් වියදම් දැරීමේ දී කාර්යක්ෂමව ඵලදායීව හා සකසුරුවම් ලෙස කටයුතු කිරීමට ආයතනය වගබලාගත යුතු වීම. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අරමුදලේ නව ආයෝජන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව, භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත්වල ආයෝජනයන්ගෙන් කිසියම් ප්‍රමාණයක් රැස්කිරීම හා විකිණීම (held to collect and sell) සඳහා පවත්වාගත යුතුය. එසේ වුවද, 2018 දෙසැම්බර් 31 දිනට අරමුදලේ රු.මිලියන 2,119,231 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත්වල ආයෝජනය මුළුමනින්ම පොලී ආදායම් රැස්කිරීම (held to collect) වෙනුවෙන් පරිණතවන තෙක් තබාගන්නා ආයෝජන ලෙස වාර්තා කර තිබුණි. එලෙස සියළුම රජයේ සුරැකුම්පත් පරිණත වන තෙක් තබා ගන්නා ආයෝජන ලෙස වර්ගකර පවත්වා ගැනීම හේතුවෙන් ඒවා ද්විතියික වෙළඳපොල තුළ විකිණීමෙන් ලබාගත හැකි මූල්‍ය වාසි උපයාගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණි. ඒ අනුව 2015 හා 2016 වර්ෂයන්හිදී භාණ්ඩාගාර බැඳුම්කර මත ප්‍රාග්ධන ලාභ පිළිවෙලින් රු.මිලියන 1,171 ක් හා රු.මිලියන 612 ක් වුවද | 2018 ජුනි මස 30 දින මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 වගන්තියේ දක්වා ඇති පරිදි සේ.අ.අ. මූලික වශයෙන් භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර මිලදී ගනු ලබන්නේ පොලී ආදායම් රැස්කිරීම සඳහා පරිනත වන තෙක් එම බැඳුම්කර /බිල්පත් රඳවා තබා ගැනීම තුලින්ය. එසේම 2.3 වගන්තිය යටතේ සේ.අ.අ. විසින් කෙටිකාලීන ලාභ බලාපොරොත්තුවෙන් භාණ්ඩාගාර බැඳුම්කර හෝ බිල්පත් මිලදී ගැනීමට සේ.අ.අ. අනුමැතියක් ලබා දී නොමැත. ඒ අනුව සේ.අ.අ විසින් භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර "hold to collect & sell" කළඹට මිලදී ගත හැක්කේ හදිසි ද්‍රවශීලතා අවශ්‍යතා සඳහා හෝ උපායමාර්ගික සම්පත් වෙන්කිරීම (SAA) ට අනුකූල වීම හෝ අවදානම් කළමනාකරණය සඳහා වන සීමිත | අරමුදලේ ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය හා ආයෝජන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රශස්ථ ලෙස අරමුදල් කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| 2017 හා 2018 වර්ෂයන්හිදී භාණ්ඩාගාර බැඳුම්කර මත ප්‍රාග්ධන ලාභ උපයාගෙන නොතිබුණි. | කාරණා සඳහා පමණක් වේ. | |
| (ආ) අරමුදල විසින් 2013 වර්ෂයේදී කැන්විල් හෝල්ඩින්ග්ස් හෝටල් සංකීර්ණය ඉදිකිරීම සඳහා රු.මිලියන 5,000 ක් ආයෝජනය කර තිබූ අතර 2013 ජූනි 04 දින අත්සන් කරන ලද කොටස් හිමියන්ගේ ගිවිසුම අනුව එම සමාගමේ කොටස් 2015 වර්ෂයේදී කොටස් වෙළඳපොලෙහි ලැයිස්තුගත කිරීමට තීරණය කර තිබුණි. එසේ වුවද, 2018 දෙසැම්බර් 31 දින වන විටත් එම සමාගමේ කොටස්, කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කර නොතිබූ අතර සමාගමේ ඉදිකිරීම් කටයුතු අත්හිටුවා දැමීමට රජය තීරණය කර ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයා විසින් දන්වා තිබුණි. | සේ.අ.අ. පාලනයෙන් බැහැර හේතූන් මත අදාළ සමාගම් ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ වී නොතිබූ අතර, ඒ අනුව මෙහෙයුම් කටයුතු ද ආරම්භ වී නොතිබිණි. එමෙන්ම අදාල සමාගම 2018.12.28 දින නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුකූලව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයට අයත්වන රාජ්‍ය සමාගමක් වන බැවින් ඊට අදාළ තීරණ ගනු ලබන්නේ මුදල් අමාත්‍යාංශය වේ. ඒ අනුව රජය විසින් විකිණීමට තීරණය කරනු ලබන වටිනාකම මත අපගේ ආයෝජනයට හිමි වන ප්‍රතිලාභය තීරණය වේ. | ආයෝජනයන් සිදු කිරීමේ දී සාමාජිකයන්ට ඉහළ ප්‍රතිලාභ ලබා දීමට හැකිවන පරිදි අවදානම අවම වන ප්‍රශස්ථ ආයෝජනයන් සිදු කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ලැයිස්තුගත හා ලැයිස්තුගත නොවූ සමාගම් 9 ක සිදුකර තිබූ රු.මිලියන 3,607 ක් වූ ආයෝජනයෙන් එම ආයෝජන සිදු කරන ලද දින සිටම අරමුදලට ප්‍රතිලාභ ලැබී නොතිබුණි. ඒ අතරින් Palm Garden Hotels PLC, Ceylon Hotels Corporation PLC, Sri Lankan Air Lines සහ The Finance Company PLC යන සමාගම්වල ආයෝජනයන් සිදුකරන විටත් ඒවා අලාභ ලබමින් පැවති බවද නිරීක්ෂණය විය. | යුද්ධය අවසන් වීමත් සමඟ සමස්ත ආර්ථිකයේ විශේෂයෙන් සංචාරක, දේපල වැනි ක්ෂේත්‍රයන්හි ඇති වූ ප්‍රබෝධය හේතුවෙන් ඒ හා සම්බන්ධ සමාගම්වල ලාභ ඉපයීමේ හැකියාව ඉහළ යතැයිද ඒ අනුව, අදාළ සමාගම්වල මිල ඉහළ යනු ඇතැයි යන අපේක්ෂාව මත දිගුකාලීන පදනමින් ආයෝජන සිදු කරන ලදී. එසේ නමුත් පසුකාලීනව ඇති වූ දේශීය හා බාහිර කරුණු මත සමස්ත වෙළෙඳපොළෙහි අපේක්ෂිත වර්ධනය සිදු නොවිනි. | ආයෝජනයන් සිදු කිරීමේ දී සාමාජිකයන්ට ඉහළ ප්‍රතිලාභ ලබා දීමට හැකිවන පරිදි අවදානම අවම වන ප්‍රශස්ථ ආයෝජනයන් සිදු කිරීමට කටයුතු කළ යුතු වීම. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

--------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පළමු අදියර 2007/2008 වර්ෂයන්හිදී ද දෙවන අදියර 2010/2011 වර්ෂයන්හි දී ද තෙවන අදියර 2016/2017 වර්ෂයන්හිදී ද ක්‍රියාත්මක කර තිබුණු සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2008 සිට 2018 දෙසැම්බර් 31 දක්වා කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික ඇස්තමේන්තුව මත මූල්‍ය ප්‍රතිපාදන සලසාගෙන රු.247,153,011 ක සමස්ථ වියදමක් දරා තිබුණි. එසේ වුවද, ඇඟිලි සලකුණු ලබාගත් සාමාජිකයන් ගණන ඇස්තමේන්තුගත සාමාජිකයන්ගෙන් ප්‍රතිශතයක් ලෙස පළමු, දෙවන හා තෙවන අදියරයන් යටතේ පිලිවෙලින් සියයට 38 ක්, සියයට 25 ක් හා සියයට 14 ක් වූ බැවින් ලබාගෙන තිබුණු ප්‍රගතිය අවම මට්ටමක පැවතුණි. | සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින්ගේ ඇඟිලි සලකුණු හා ඡායාරූප ලබා ගනිමින් සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය බාහිර ආයතනයක් ලවා සිදු කරවා ගැනීමට අපේක්ෂා කළද සේවා සැපයීම සඳහා බාහිර ආයතනයක් ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය යොදා ගෙන ආයතනයන් වෙත ගොස් දත්ත ලබා ගැනීමේ කටයුතු ආරම්භ කිරීමට තීරණය කරන ලදී. එහෙත් මෙම කාර්යය දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය වෙත පවරන ලද අමතර රාජකාරියක් වන බැවින් සහ එම නිලධාරීන්ට පූර්ණ කාලීනව මෙම ව්‍යාපෘතිය සඳහා යෙදවීමේ හැකියාවක් නොවූයෙන් අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගත නොහැකි විය. | සාමාජික අරමුදලින් වියදම් දැරීමේදී කාර්යක්ෂමව, ඵලදායීව හා සකසුරුවම් ලෙස කටයුතු කර අදාළ ප්‍රගතිය අත්කර ගැනීමට අවධානය යොමුකළ යුතු වීම. |
| (ආ) Kiosk යන්ත්‍ර සවි කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ 2015 වර්ෂයේදී රු.14,917,500 ක් වැයකර මිලදීගෙන තිබූ යන්ත්‍ර 30 න් 2018 දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර 10 ක් අක්‍රීයව පැවතුණි. මේ නිසා ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත නොහැකිව තිබුණි. | 2015 වර්ෂයේදී මිලදී ගත් Kiosk යන්ත්‍ර 30 න් 2018.12.31 දිනට යන්ත්‍ර 20ක් ක්‍රියාත්මක තත්වයේ පවතී. | ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වීම. |
| (ඇ) ප්‍රතිලාභ ලබාගැනීම සඳහා සාමාජිකයන් විසින් දිස්ත්‍රික් කම්කරු කාර්යාල 18 කට 2016 ජනවාරි 01 සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ ඉදිරිපත් කර තිබූ ප්‍රතිලාභ අයදුම්පත් අතරින් රු.17,923,106 ක් අයදුම්කර තිබූ අයදුම්පත් 112 ක් ගෙවීම් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කිරීමෙන් අනතුරුව විවිධ හේතු මත ප්‍රතික්ෂේප කර තිබුණි. එම | යම් සාමාජිකයෙකු ප්‍රතිලාභ අයදුම් කරන අවස්ථාවකදී කම්කරු දෙපාර්තමේන්තු දත්ත පද්ධතියෙහි ඇතුලත් තොරතුරු හා ශ්‍රී ලංකා මහ බැංකු දත්ත පද්ධතියෙහි ඇතුලත් තොරතුරු අතර විෂමතා පැවතීම, සේවායෝජක ආයතන විසින් දායක මුදල් බැර කිරීමේදී සිදු කරනු ලබන වැරදි හේතුවෙන් සාමාජික ගිණුම්වල වෙනස් කිරීම් සිදු කළ යුතු වීම හා සාමාජිකයා ප්‍රතිලාභ අයදුම් පතෙහි සඳහන් කරන ලද සේවය අවසන් කළ දිනය වෙනස් වන අවස්ථාවලදී ආයතනය | සාමාජිකයන්ට ප්‍රමාදයකින් තොරව ප්‍රතිලාභ ලබාදීමට හැකි සෑම පියවරක්ම ගතයුතු වීම. |

| | | |
|---|---|---|
| අයදුම්පත් අතරින් අයදුම්පත් 90 ක් (සියයට 80ක්) සම්බන්ධයෙන් ඒවා ඉදිරිපත් කරන ලද දින සිට 2019 මාර්තු 01 දක්වා ගත වී තිබූ කාලය මාස 06 සිට අවු.03 ට වැඩි වී තිබුණද ඒවා නිරවුල්කිරීමට කටයුතු කර නොතිබුණි. | වෙතින් තොරතුරු කැඳවා අදාල නිවැරදි කිරීම් සිදු කළ යුතු වීම ආදි කටයුතු සඳහා සැලකිය යුතු කාලසීමාවක් ගත වේ. | |
| (ඇ) ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව අනුව 2018 වර්ෂය අවසාන වන විට පෞද්ගලික අංශයේ හා අර්ධ රාජ්‍ය අංශයේ මුළු සේවා නියුක්තිය ලෙස වාර්තා වී ඇති 3,727,217 කින් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය ලබාගෙන ඇති සක්‍රීය සාමාජික සංඛ්‍යාව 2,559,319 ක් හෙවත් සියයට 68.7 ක් විය. අනෙකුත් අනුමත අර්ථසාධක අරමුදල්වල සාමාජිකත්වය දරන සේවක සංඛ්‍යාව සියයට 9.7 ක් පමණක් වීමෙන් ඉතිරි සියයට 21.6 ක් වූ ප්‍රමාණය කිසිදු අරමුදලකට දායකත්වයක් දරා නොතිබුණි. මොවුන්ට අරමුදලේ සාමාජිකත්වය ලබාදීම කෙරෙහි වැඩි අවධානයක් යොමු විය යුතු බව නිරීක්ෂණය විය. | කිසිදු අරමුදලක දායකත්වය දරා නොමැති සාමාජිකයින්ට සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබාදීම සම්බන්ධ කටයුතු සහ ඊට අදාල නීතිමය තත්ත්වයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා 2018 වර්ෂයේ දී රූපවාහිනී දැන්වීම් හරහා ප්‍රචාරණ කටයුතු සිදු කිරීම, ගුවන් විදුලි දැන්වීම් හරහා ප්‍රචාරණ කටයුතු සිදු කිරීම හා ජංගම සේවා මගින් දැනුවත් කිරීමේ කටයුතු සිදුකිරීම යන ක්‍රියාමාර්ග ගෙන ඇත. | පෞද්ගලික අංශයේ හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන් උපරිම සංඛ්‍යාවකට අරමුදලේ සාමාජිකත්වය ලබාදිය හැකි ක්‍රමවේදයක් සකස් කිරීම කෙරෙහි ආයතනයේ අවධානය යොමු කර වැඩ පිළිවෙලක් සකස් කළ යුතු වීම. |
| (ඉ) සේවක අර්ථසාධක අරමුදලේ ලියාපදිංචි නොවී සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ මණ්ඩලයේ පමණක් ලියාපදිංචි වී තිබූ සේවායෝජකයින් සංඛ්‍යාව 2018 දෙසැම්බර් 31 දිනට 14,156 ක් වූ අතර එම සේවායෝජකයන්ගෙන් එදිනට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට ලැබී තිබූ දායක මුදල්වල එකතුව රු. 148,366,135 ක් විය. ඒ අනුව එම සේවායෝජකයන් අරමුදලේ ලියාපදිංචි කර ගැනීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සමග එක්ව සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි. | ස්වයං රැකියා නියුක්තිකයන්හට සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක වීමට සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් ප්‍රතිපාදන සලසා නොමැති වුව ද සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත අනුව ස්වයං රැකියා නියුක්තිකයන් හට සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා දායකවීමට ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව සේවක අර්ථසාධක අරමුදලේ ලියාපදිංචි නොවී සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලෙහි පමණක් ලියාපදිංචි වූ සේවායෝජක සංඛ්‍යාවෙහි ස්වයංරැකියා නියුක්තිකයන් ද ඇතුලත් වන බවත් දන්වමි. | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ පමණක් ලියාපදිංචි වී ඇති (ස්වයං රැකියා නියුක්තිකයන් නොවන) සාමාජිකයන්ට සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබාදීම සඳහා වැඩපිළිවෙලක් සකස් කළ යුතු වීම. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

-----------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේදී රු.3,261,600 ක් වැයකර මිලදීගෙන තිබුණු ලැප්ටොප් පරිගණක 24 ක් 2019 මැයි 23 දින වනවිටත් අදාල කාර්යාලවලට බෙදා නොහැර ගබඩාවේ නිශ්ක්‍රීයව තබා තිබුණි. | උක්ත ව්‍යාපෘතිය වෙනුවෙන් අවශ්‍ය ලැප්ටොප් පරිගණක, ඊට අදාල මෘදුකාංගය, ස්කෑනර්, කැමරා ආදී උපකරණ රැසක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු 2018 වර්ෂයේදී ආරම්භ කළද මිලදී ගත හැකි වූයේ ලැප්ටොප් පරිගණක 24 පමණි. උපාංග කට්ටල වශයෙන් භාවිතා කෙරෙන බැවින් ලැප්ටොප් පරිගණක පමණක් බෙදා හැරිය නොහැකි බවත් සියලු උපකරණ මිලදී ගත් පසු බෙදා හැරීම් කටයුතු ඉටු කරන බවත් කාරුණිකව දන්වමි. | නිසි අවශ්‍යතා හඳුනාගැනීමෙන් අනතුරුව වත්කම් මිලදීගත යුතු අතර ඒවා කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

--------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇඟිලි සලකුණු හා ඡායාරූප ලබා ගැනීමේ ව්‍යාපෘතිය සඳහා 2018 වාර්ෂික ඇස්තමේන්තුව තුළ ප්‍රතිපාදන වෙන්කරවා ගෙන තිබුණ ද අදාළ වැය විෂයයන් යටතේ ප්‍රසම්පාදනයන් සැලසුම් කර නොතිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව 221-2-4-1409 වැය විෂයය යටතේ රු.11,000,000 ක අයභාර ප්‍රතිපාදන වෙන්කර තිබුණද එම වැය විෂයය යටතේ ප්‍රසම්පාදනයන් සැලසුම් කර නොතිබුණි. එසේම 221-2-4-2103 දරන ප්‍රාග්ධන වැය විෂයය යටතේ රු. 17,000,000 ක ප්‍රතිපාදන වෙන්කරවා ගෙන තිබුණද රු. 4,321,700 ක ප්‍රසම්පාදනයන් පමණක් සැලසුම් කර තිබුණි. ඒ අනුව අවශ්‍යතාවය හඳුනා ගැනීමෙන් හා විධිමත් සැලසුම් සකස් කිරීමෙන් තොරව ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම හේතුවෙන් පසුව ප්‍රතිපාදන මාරු කිරීමටත් ප්‍රතිපාදන ඉතිරි කිරීමටත් සිදුවී තිබුණි. එසේම ප්‍රසම්පාදන සැලැස්ම වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට අනුගත නොවන බවද නිරීක්ෂණය විය. | 2017 වර්ෂයේදී දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය යොදා ගෙන මෙම කාර්යය සිදු කිරීමට තීරණය කරනු ලැබූයේ, 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කළ පසුව බැවින් 221-2-4-1409 වැය විෂය යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ඉතිරි වූ බව කාරුණිකව දන්වමි. | නිසි අවශ්‍යතා හඳුනාගැනීමෙන් අනතුරුව ප්‍රසම්පාදනයන් සැලසුම් කළ යුතු අතර ඒ අනුව ප්‍රතිපාදන වෙන්කරවා ගැනීමට කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

**විගණන නිරීක්ෂණය**

----------------------

(අ) සේවක අර්ථසාධක අරමුදලේ ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලයට මුදල් මණ්ඩලය මගින් අනුමත කාර්ය මණ්ඩලයක් නොවූ අතර, ඒ සඳහා 2016, 2017 හා 2018 වර්ෂවලදී පිළිවෙලින් 184 ක, 176 ක හා 166 ක කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබුණි.

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**

---------------------------------------

සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන අනුව, සේවක අර්ථසාධක අරමුදලේ කාර්යයන් සඳහා අවශ්‍යවන සංඛ්‍යාව අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයන් අනුයුක්ත කර ඇත. කෙසේ වුවද, අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලයේ යම් කිසිවෙක් විශ්‍රාම ලබයි නම් එම තනතුර පිරවීම ඊළග කාර්ය මණ්ඩල බඳවා ගැනීම දක්වා කල්යාම සිදු වේ. ඒ අනුව, විගණන නිරීක්ෂණයේ සඳහන් සේවක සංඛ්‍යාව අදාළ වර්ෂ අවසානයේ දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කළ සංඛ්‍යාව වේ.

**නිර්දේශය**

------------

නිවැරදි කාර්යමණ්ඩල ඇගයීමක් සිදුකර ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වීම.

(ආ) අරමුදලේ ඒක සේවක පිරිවැය 2017 හා 2018 වර්ෂයන්ට අදාළව පහත දැක්වේ.

| | **2018 වර්ෂය** | | **2017 වර්ෂය** | |
|---|---|---|---|---|
| | **කම්කරු දෙපාර්ත මේන්තුව** | **ශ්‍රී ලංකා මහ බැංකුව** | **කම්කරු දෙපාර්ත මේන්තුව** | **ශ්‍රී ලංකා මහ බැංකුව** |
| වැටුප් පිරිවැය (රු'000) | 407,899 | 559,472 | 387,855 | 459,475 |
| තත්‍ය සේවක සංඛ්‍යාව | 861 | 166 | 805 | 176 |
| ඒක සේවක පිරිවැය (රු'000) | 474 | 3,370 | 482 | 2,611 |
| ඒක සේවක පිරිවැයේ වෙනස (රු'000) | 2,896 | | 2,129 | |

කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම: ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙහි කාර්ය මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලයෙන් අදාළ දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරනු ලැබූ කාර්ය මණ්ඩලයක් වේ. එම කාර්ය මණ්ඩලය සඳහා අනෙකුත් රාජ්‍ය බැංකු වලට සමගාමීව වැටුප් ව්‍යුහයක් සකසා ඇති අතර, එය රජයේ දෙපාර්තමේන්තු වල වැටුප් සමග ඍජුව සැසඳිය නොහැක.

නිර්දේශය: අරමුදලේ ඒක සේවක පිරිවැයේ විෂමතා අවම කිරීමට කටයුතු කළ යුතු වීම.

දෙපාර්තමේන්තුවේ ඒක සේවක පිරිවැය සමග සැසඳීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයේ ඒක සේවක පිරිවැය 2017 වර්ෂයේ දී රු. 2,129,000 කින්ද 2018 වර්ෂයේදී රු. 2,896,000 කින්ද වැඩි වී තිබූ බව නිරීක්ෂණය විය. මීට ප්‍රධාන වශයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ වැටුප් අතර පවත්නා වැටුප් විෂමතා හේතු තිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයේ 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාජ ආරක්ෂණය ශක්තිමත් කිරීමේ උපාය මාර්ගය යටතේ ජාතික හැඳුනුම්පත් අංකය සේවක අර්ථසාධක අරමුදල් අංකය බවට පත් කිරීමේ හා ඇඟිලි සලකුණු ලබාගැනීමේ ව්‍යාපෘතිය යටතේ සිදු කිරීමට සැලසුම් කර තිබූ නිතිරීති සම්පාදනය කිරීම, දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල තාක්ෂණික ධාරිතාවය වැඩිදියුණු කිරීම, නියමු ව්‍යාපෘතියක් (Pilot Project) දියත් කිරීම හා ජාතික හැඳුනුම්පත් අංකය සේවක අර්ථසාධක අරමුදල් අංකය ලෙස ලියාපදිංචි කිරීම යන ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂයේදී ඉටුකර නොතිබුණි. | ජාතික හැඳුනුම්පත් අංකය සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රමුඛ දත්තය බවට පත් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කමිටු වාර්තාවක් සකස් කරන ලද අතර 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව එම ව්‍යාපෘතිය මගින් සිදු කිරීමට සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් 2018 වර්ෂයේ දී ඉටු කිරීමට සේවක අර්ථසාධක අරමුදල අපොහොසත් වූ අතර ඉදිරියේ දී මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකරන බවත් දන්වමි. | ක්‍රියාකාරී සැලැස්ම තුළ දක්වා ඇති කාර්යයන් ඉටුකිරීමට කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයන් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 4.2 රාජ්‍ය ගිණුම්කාරක සභා නිර්දේශ හා වර්තමාන තත්ත්වය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 පෙබරවාරි 26 දිනැති අංක 09 දරන නිර්දේශය අනුව, අරමුදලේ තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධ වී එක් පරිගණක වැඩසටහනක් සකස් කිරීමේ හැකියාව පිළිබඳව වාර්තාවක් 2016 මාර්තු 23 දිනට පෙර කාරක සභාවට යොමු කරන ලෙස උපදෙස් ලබාදී තිබුණි. ආසියානු සංවර්ධන බැංකුව විසින් රජයට ලබාදෙන ණය ප්‍රතිපාදනයක් යටතේ ක්‍රියාත්මක වන ප්‍රාග්ධන වෙළඳපල දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ව්‍යාපාර ක්‍රියාවලි සමාලෝචනයක් සිදුකිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබාදීමට එකඟතාවය ලබාදී ඇති බවත් ඒ යටතේ ඒකාබද්ධ නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කෙරෙමින් පවතින බවත් සේවක අර්ථසාධක අරමුදලේ අධිකාරී විසින් විගණනය වෙත වාර්තා කර තිබුණි. එසේ වුවද එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ණය ගිවිසුම, ව්‍යාපෘති වාර්තාව හා ව්‍යාපෘති සැලැස්ම ආදී තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබූ බැවින් එම නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කළ නොහැකි විය. | රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නිර්දේශයන්ට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව සහ කම්කරු දෙපාර්තමේන්තුව විසින් වඩාත් පුළුල් හා උපායශීලී ප්‍රවේශයන් යටතේ, ඒකාබද්ධ නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කෙරෙමින් පවතී.<br>මේ සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් රජයට ලබාදෙන ණය ප්‍රතිපාදනයක් යටතේ ක්‍රියාත්මක වන "ප්‍රාග්ධන වෙළඳපොල දියුණු කිරීමේ ව්‍යාපෘතිය" සම්බන්ධයෙන් ණය ගිවිසුම ශ්‍රී ලංකාණ්ඩුව වෙනුවෙන් මුදල් අමාත්‍යාංශය හා ආසියානු සංවර්ධන බැංකුව අතර අත්සන් තැබුණු ගිවිසුමක් බැවින් අදාළ ණය ගිවිසුම මුදල් අමාත්‍යාංශය වෙතින් ලබා ගැනීමේ හැකියාව පවතී. | රාජ්‍ය ගිණුම්කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත් ඒවායේ ප්‍රගතිය සහ අනෙකුත් අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 4.3 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සේවක අර්ථසාධක අරමුදලට ස්වාධීන වූ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැති අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයේ අභ්‍යන්තර විගණන කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය මගින් ඉටු කර තිබුණි. අරමුදලේ පරිපාලන කටයුතු සිදුකරනු ලබන කම්කරු දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 14 ක් හා තථ්‍ය සංඛ්‍යාව 09 දෙනෙකුට සීමාවී තිබුණි. දෙපාර්තමේන්තුව | 2018.12.31 දිනට අභ්‍යන්තර විගණන අංශයේ රාජ්‍ය කළමනාකරන සහකාර සේවයේ නිලධාරීන් අනුමත සංඛ්‍යාව 10 දක්වා වැඩිකර ඇති අතර මේ වන විට අනුයුක්ත කර ඇති නිලධාරීන් සංඛ්‍යාව ද 07 දක්වා වැඩිකර ඇත.එසේම දීර්ග කාලයක සිට මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රස්තුත | අභ්‍යන්තර විගණන අංශයට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| සතුව ප්‍රාදේශීය කාර්යාල 57 ක් පැවතීම හා සිදුවන ගනුදෙනුවල ප්‍රමාණය අනුව තත්‍ය සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීමෙන් සේවක අර්ථසාධක අරමුදලේ විගණන කටයුතු සඳහා වැඩි අවධානයක් යොමු කිරීමට අවස්ථාව නොමැති බව නිරීක්ෂණය විය. දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනය ශක්තිමත් කළයුතු බවට 2013 වර්ෂයේ සිට දිගින් දිගටම රාජ්‍ය ගිණුම්කාරක සභා රැස්වීම් වලදී නියෝග කර තිබුණද, ඒ අනුව ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර විගණනයක් සිදු කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | සේවයේ නිලධාරීන් විශාල සංඛ්‍යාවකගේ පුරප්පාඩුවක් පවතින අතර ඉදිරියේ දී දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු සම්පූර්ණ වන ආකාරය අනුව අභ්‍යන්තර විගණන අංශය සඳහා ද නිලධාරීන් ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරනු ලබන බවත් දන්වමි. | |

**4.4 විගණන කමිටුව**

---------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදලට අදාලව විගණන කමිටු රැස්වීම් කම්කරු අමාත්‍යාංශය යටතේ සියලු ආයතන හා එක්ව පවත්වනු ලැබේ. ඊට අමතරව කම්කරු දෙපාර්තමේන්තුව යටතේ වෙනම විගණන කමිටුවක් පැවැත්වුවද, ඊට අරමුදලේ මූල්‍ය පරිපාලන කටයුතු සිදු කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුව හා එහි අභ්‍යන්තර විගණකයින්ගේ සහභාගිත්වයක් නොතිබුණි. රු. බිලියන 2,289 ක් පමණ ඇති අරමුදලක් වෙනුවෙන් වෙනම විගණන කමිටුවක්, අරමුදලේ කටයුතු සඳහා අනුයුක්ත කර සිටින කම්කරු දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වීමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව සෑම කාර්තුවකටම වරක් කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලට සහභාගී වේ.<br>ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවෙහි විෂය පථය යටතට ගැනෙන අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයෙහි සාමාජිකයෙකුගේ සහභාගිත්වය සහිත උපදේශාත්මක විගණන කමිටුව මගින් එම විගණන කටයුතු සමාලෝචනය කරනු ලබයි. | අරමුදලට ස්වාධීන වූ විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවීමට කටයුතු කළ යුතු වීම. |